# 7 ශ්‍රේණිය සිංහල

## 19. දුං දුමටයි අඟුරු මටයි



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(online පංතියට සහභාගී වුනු සිසුන් ප්‍රායෝගික අභ්‍යාස “පාරම්පරික සන්නිවේදන ක්‍රම” යන මාතෘකාවට සඟරාවක පළ කිරීමට සුදුසු ලිපියක් යටතේ එවා තිබූ සටහන් කිහිපයකි.)

## සාම්ප්‍රදායික සන්නිවේදනය

එක් එක් ජන කණ්ඩායම් තම සංස්කෘතිය ගොඩ නගා ගන්නා ලද්දේ තම පරිසරය ඇසුරු කර ගනිමිනි. ඒ අනුව ඔවුන්ගේ සමාජයෙහි සංස්කෘතික පැවැත්මට අවශ්‍ය සන්නිවේදනාංග ඔවුහු නිපදවා ගත්හ.

ඇඳුම් පැළඳුම්, ආචාර සමාචාර, විවිධ සිරිත් විරිත්, විවිධ ඇදහිලි, පූජා ක්‍රම, නර්තන, ගායනා, පුරාණෝක්ති හා විවිධ කලාත්මක කාර්යයන් ආදිය මෙම සන්නිවේදනාංගයන්ට අයත් වේ. මේවා සාම්ප්‍රදායික සන්නිවේදනය යනුවෙන් හැඳින්විය හැකි ය. එක් ජන කණ්ඩායමක් තවත් ජන කණ්ඩායමකින් වෙනස් වන්නට සාම්ප්‍රදායික සන්නිවේදනය අතිශයින් හේතුකාරක වේ.



දුම මගින් සංඥා යැවීම



අඬබෙර ගැසීම



දැන්වීම් ප්‍රදර්ශනය



සංකේතයක් මගින් සන්නිවේදනය

**සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම කිහිපයක්**

ගිනිමැලය, දුම, හුව, කොළ අතු එල්ලීම, බෙරය, නලාව, යනාදි ප්‍රාථමික සන්නිවේදන ක්‍රම යොදා ගනිමින් ආදි කාලීන ගෝත්‍රික සමාජයන්හි පණිවුඩ හුවමාරු කර ගත් ආකාරයට අදටත් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම භාවිත කරන ආකාරය හඳුනා ගත හැක.

අපගේ ග්‍රාමීය සමාජයෙහි පවතින බලිතොවිල් ආදියෙහි ද දකින්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික සන්නිවේදන ලක්ෂණ ය. ලෙඩරෝග සඳහා කොළ අතු එල්ලීම, නූල් මැතිරීම, සුර ඇඹීම, කෙම් ක්‍රම, තහංචි, මංගල හා අවමංගල චාරිත්‍ර විධි මෙන් ම ජනකවි, ගැමි නාටක, මෑතකාලීන ජනකතා, කවිකොළය, විරිදු හා රූකඩ ආදිය ද සාම්ප්‍රදායික සන්නිවේදන භාවිතයන් ය. ලෝකයේ කුමන රටක, කුමන ජන කණ්ඩායමක් අධ්‍යයනය කළත් මෙවැනි විවිධ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම සොයා ගත හැකි ය. මෙහි විශේෂය වන්නේ ඒ කුමන හෝ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් ඒ ජන කණ්ඩායමට සුවිශේෂ වන බව ය.

Rayumi

# පාරම්පරික සන්නිවේදන ක්‍රම.

ඈත අතීතයේ අද මෙන් දියුණු තාක්ෂණයක් නොතිබුණි. එම නිසාම අතීතයේ ජංගම දුරකථන, ඊමේල් විදුලි යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නොතිබුණි. ඒ නිසා ~~ඈත~~ අතීතයේ පොදුජනයා මහජනතාව සඳහා පණිවිඩ ඒ ලබා දීමටත්. එම පණිවිඩ එහාමෙහා අතර හුවමාරු කර ගැනීමටත් භාවිත කර ඇත්තේ මෙම පාරම්පරික සන්නිවේදන ක්‍රම වේ. එනම්, අතීතයේ රජේ ප්‍රධානී රජවරුන්ගේ වැදගත් පණිවුඩ අඬබෙරයක් ගමට ලබා දී මහජනතාව දැනුවත් කරන අතර මිනිසුන් අතර පණිවිඩ හුවමාරු කර ගනු ලබන්නේ, හූ කීමෙන් අතර මෙම පණිවිඩ හුවමාරුව සඳහා මිනිසුන්ගේ හඬවල් පමණක් නොව ඇසට පෙනෙන දේවල් ~~ගො~~ ද භාවිත කළේ ය. එනම්, "දුම් කොබ", රෙදි ධජ කොඩි වැනි දේ ය. මේවා අතරින් දුම් කොබ යනු රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයකි. මෙම දුම් කොබයකින් නිකුත්වන පණිවිඩය එහි වලලු ගොන අනුව වෙනස් වේ. මේ ආදි වශයෙන් අතීතයේ ආදි කුලීන් මිනිසුන් සහ වෙනත් රටවල ජාතීන් පණිවිඩ හුවමාරු කර ගත්තේ ය.



Matheesha

ප්‍රායෝගික අභ්‍යාසය

## පාරම්පරික සන්නිවේදන ක්‍රම

හූ කීම, අඟ බෙර ගැසීම, දුම් ගොබ යැවීම, ඝන්ටාර ගැසීම ආදිය පාරම්පරික සන්නිවේදන ක්‍රම වේ.

අඳන මෙල්යාගේ ඉස්මත්තේ කිසිවෙකු යන විට ඔහුගේ අවධානය යොමු කර ගැනීමට, නැති වූ හරක බාන සොයා කැළෑ වදින ගැමියන් නම කියා අදහස් හුවමාරු කිරීමට, හේනට ගිනි තැබීමට පෙරත්, ඒ බව අනෙක් ගොවියන්ට දැනුම් දීම පිණිස 'හූ' කීම යොදා ගනිති. අඳන යන්නනාට කතා කරන්නට වුවමනා වූ විට නගාන හූ එක ගමේ පුදු පෝළට පොලී-සියෙන් පාන්න විට නගාන හූ එක එක සමාන නොවන බව ගැමියෝ දනිති. එසේ නොවන්නට 'හූ' කීම සන්නිවේදන ක්‍රමයක් ලෙස ගත නොහැකි වනු ඇත.





එවක හැම ගමක ම විහාරස්ථානයක් පිහිටා තිබිණි. එකල වෙනත් ආගම් ව්‍යාප්තව නොතිබූ සමයයි. එම නිසා එක පැත්තක 'හූ' හඬක් ඇසුණු විට ගම්මු ගෙවල් වලින් එළියට බැස ඒකරාශී වීමට හේතුවක් ඇත.

ගමේ පන්සලේ ඝන්ටාරයද ඉතා ප්‍රබල සන්නිවේදන මාධ්‍යකි. සාමාන්‍ය දවසක දහවල් එකොළහට පමණ ඇසෙන ඝන්ටාර හඬ ගමට ගෙනෙන පණිවිඩය නම් පන්සලේ හාමුදුරුවො බුදු ගෙට වැඩ බුදුන් වහන්සේට ආහාර පූජා කර අවසන් වූ බවය. මේ සඳහා ඝන්ටාරය තුන් වරක් නාද කෙරේ. ඝන්ටාරය ඉතා වේගයෙන් නාද කෙරේ නම් එයින් කියවෙන්නේ ගමේ පන්සලේ කිසිවෙකුට හදිස්සියක් හෝ අනතුරක් සිදු වී ඇති හෙයින් ගම්මු පන්සලට එක් රැස් කිරීමේ අරමුණ ඇති බවය.



තවත් ආකාරයකට ඝන්ටාරය සද
ගසා පන්සලේ කාලක දානය වැරදී ඇති
බව ගම් වැසියන්ට දැනුම් දෙයි. එවිට ගම්මු
තමාට හැකි විදිහෙන් බත් වෑංජන පිස
පන්සලට රැගෙන යති. හැන්දෑවේ ගිලන් පස
පූජාවට එක් රැස්ව සිටින උපාසක උපාසිකාවෝ
“සද්ද පූජාවට” පසුවද ඝාණ්ටාර නාද කරති.



1 (x). තො.තා.ඛවා සුළි සායම්ත්

Asinsani

* ප්‍රායෝගික අභ්‍යාස

page 01



# පාරම්පරික සන්නිවේදන ක්‍රම

සන්නිවේදනය යන වදන අලුත් වුවත් සන්නිවේදන කාර්ය අප සමාජයට අලුත් දෙයක් හෝ අරුමයක් නොවේ. එදා අපට :

අවන්විදුලියක් හෝ රූපවාහිනියක් නොතිබුණත්
එබඳු ජනමාධ්‍යවලින් ඉටු කෙරෙන කාර්ය
ඉටු කිරීම සඳහා වෙනත් මාර්ග පැවතුණේය.
මේ මාර්ග අද වර්තමානයේ හැඳින්වෙන්නේ
පාරම්පරික සන්නිවේදන ක්‍රම යන නමිනි.
මේ ක්‍රම අඩු වැඩි වශයෙන් අද වර්තමානයේ
වුවත් ගම් බද ප්‍රදේශවල පවතී.

පාරම්පරික සන්නිවේදන මාධ්‍ය
කිහිපයක් පවතියි. ඒවා නම්

* අඬ බෙර ගැසීම.
* දුම් කොඩ යැවීම.
* හූ කීම
* පන්සලේ ඝණ්ටාරය ගැසීම.

අඬ බෙර ගැසීම පාරම්පරික සන්නිවේදන
මාධ්‍යයකි. අඬ බෙරය ගැසීම සඳහා බොහෝ
විට යොදා ගන්නේ දවුලයි. මේ දවුලේ හඬ
ඇසෙන විට, එයින් කියවෙන්නේ මහ
රජ්ජුරුවන්ගේ අණක් හෝ අඬෝවක් බව පැරණි
ගැමියෝ දැන සිටිය හ. බෙර හඬින් ප්‍රකාශ
වූයේ රජ්ජුරුවන්ගේ අණක් නිසා මෙය
හැඳින්වෙන්නේ අණ බෙර යනුවෙනි. එය
පසු කාලයකදී අඬ බෙරේ බවට පත් වූයේය.

වර්තමානයේ සමහර ගම් පළාත්වල තොරතුරු දැන්වීම උදෙසා අඬ බෙරය යොදා ගැනුනත් විශේෂයෙන් ම ගම් සභාවේ රැස්වීමක් පවත්වන දිනය හෝ වැවේ ජලය මුදා හරින දිනය ගොවි ගැමියන්ට දැන්වීම පිණිස මෙය භාවිතා කරනු කරන්නේ ය.

පණිවිඩ යැවීම සඳහා දුම්ගොඩ යොදා ගැනීම රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයකි. සමහර විට දුම් ගොඩකින් කියවෙන පණිවිඩය එයින් මතු වන දුම් වළලු ගණන අනුව වෙනස් වේ. සිංහලයන් ද දුම් ගොඩ මගින් පණිවිඩ යැව්වේය. රටට සතුරන් ආ අවස්ථාවල, ඒ බව රජ වාසලට වහා ම දැනුම් දෙන ලද්දේ දුම් ගොඩ අහසට යැවීමෙන්යැයි පැරැන්නෝ කියති. මේ සඳහා කඳුමුදුන්වල මුර පොළවල් පිහිටුවා තිබුණේ ය. වර්තමානයේ දුම් ගොඩ යවා පණිවිඩ යැවීමේ පිළිවෙතක් නැතත්, ආදියෙහි එවැන්නක් පැවති බවට සිංහල ජනශ්‍රැතියෙන් නිදසුන් සොයා ගත හැකිය. ගිනි ගොඩ ක් දුමක් නැගෙන විට සිංහල දරුවෝ මෙසේ කියමින් කෑ ගසති.

දුං දුමටයි අළුරු මටයි - මේ යනා දුං කෝච්චි වටි

අදහස් ප්‍රකාශ කිරීම සඳහා කාටත් වුවත් ලෙහෙසියෙන් ම යොදා ගත හැකි මාධ්‍යයක් නම් කටහඬයි. 'කාට ද බැරි යැ කියන්ට" යැ කියමන් අදහස් පළ කිරීමට කටට අමුතු දෙයක් නොවෙයි. ඈත මෙල්ලාය ඉස්මත්තේ කිසිවකු යනවිට ඔහුගේ අවධානය යොමු කර ගැනීම ඇති හොඳම මාර්ගය හූවක් කීමයි. හැකි මුත් හරකා බානා කොයා කැලෑ වැදෙන ගැමියන්ට තම තමන් අතර අදහස් හුවමාරු කර ගැනීමට ඇති හොඳම මාර්ගය හූ කීමයි.

අතීතයේ පත්තල, ජනසන්නිවේදනයේ මධ්‍යස්ථානයක් වූ බැවින් ඝණ්ටාරය බොහෝ අවස්ථාවලදී භාවිත විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමයේ රාත්‍රී නවයට පමණ ඝණ්ටාරය නාද වූවහොත් නගරයේ නිවෙස්වල පහන් නිවා දැමීමට සිදුවේ.

ජන කවි ද විදා සන්නිවේදනය සඳහා යොදාගත් බවට බොහෝ සාක්ෂි ඇත. ඒ ඒ පුද්ගලයන් අතරමෙන්ම සමූහයන් අතර ද සාමේරි-කා සන්නිවේදන ක්‍රම ඉහත ආකාරයට අතීතයේ භාවිත කෙරුණි

H.A. ධාසිංසනි නාවෝදා
7 ශ්‍රේණිය

ප්‍රායෝගික අභ්‍යාසය

"පාරම්පරික සන්නිවේදන ක්‍රම"

★ වර්තමානයේ ගුවන් විදුලිය, රූපවාහිනිය ආදී ජන මාධ්‍යවලින් ඉටු කෙරෙන කාර්යය ඉටුකිරීම සඳහා අතීතයේ පැවති වෙනත් සන්නිවේදන ක්‍රමවලට පාරම්පරික සන්නිවේදන ක්‍රම යැයි කියනු ලැබේ. උදා:- අඬබෙර ගැසීම, රෙදිකොඩි එසවීම, දුම් ගොබ අහසට යැවීම, හූ තැබීම, සක්පාරය නාද කිරීම.

★ අඬබෙරය ගැසීම යනු පාරම්පරික සන්නිවේදන ක්‍රමයකි. මේ සඳහා බොහෝ විට යොදා ගන්නේ දවුලකි. අතීතයේදී "රාජ අණක්" නිකුත් කිරීම සඳහා අඬබෙරය යොදා ගැනිණි. වර්තමානයේ ද සමහර ගම් ප්‍රදේශවල තොරතුරු දැන්වීම උදෙසා අඬ බෙරය යොදා ගනී. උදා:- ගම් සභාවේ රැස්වීමක් පැවැත්වෙන දිනය ගැමියාට දැන්වීම පිණිස, වැවේ වතුර මුදා හරින දිනය ගැමියාට දැන්වීම පිණිස.

★ දුම්ගොබ යැවීම යනු පණිවිඩ යැවීමේ ක්‍රමයකි. පණිවිඩ යැවීම සඳහා "දුම් ගොබ" යොදා ගැනීම රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර මෙතෙක් ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයකි. සිංහලයන් ද දුම් ගොබ මගින් පණිවිඩ යවා ඇති බව පෙනේ. උදා:- රටට සතුරන් අවස්ථාවල ඒ පුවත රජවාසලට දැනුම් දීම සඳහා.

Date No

* භාෂාව යනු අදහස් ප්‍රකාශ කිරීම සඳහා සංකේත වශයෙන් යොදා ගත හැකි මාධ්‍යයකි. අතීතයේ මෙන්ම වර්තමානයේ දී ද යොදා ගැනේ. උදා:- කැණීම්/පු හරසා භාෂා ලෙස කාලය මැනීම දී, ශිලාලේඛන කියවීමේ දී රජවරුන්ගේ කාර්යයන් සඳහා කාලයන් සොයා ගැනීමේ දී.

* ඝණ්ටාරය නාද කිරීම යනු ඉතා වැදගත් සන්නිවේදන කාර්යයකි. ඝණ්ටාරයට පෙවරේ සාමාන්‍ය දිනක උදේ එකොළහට පමණ ඇසෙන ඝණ්ටාරයේ නාදයෙන් අදහස් කරන්නේ පන්සලේ හාමුදුරුවෝ බුදුගෙට වැඩ, බුදුන් වහන්සේට ආහාර පූජා කොට අවසන් වූ බවයි.

